# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2490/04 - 2026 මැයි මස 25 වැනි සඳුදා - 2026.05.25

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### දඹුල්ල මූලික රෝහල සංවර්ධනය හා වැඩිදියුණු කිරීම සඳහා රේඛීය සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය වෙත පවරා ගැනීම

දඹුල්ල මූලික රෝහල වර්තමානයේ මධ්‍යම පළාත් සභාව මඟින් පරිපාලනය කරනු ලබන අතර එය මාතලේ දිස්ත්‍රික්කයේ පිහිටා ඇත. 2022 - 2032 දඹුල්ල සංවර්ධන මහා සැලැස්ම අනුව, මහජනතාවට වැඩිදියුණු කරන ලද සෞඛ්‍ය සේවා සැපයීම සහ වත්මන් ඉඩම ආර්ථික සංවර්ධන අරමුණු සඳහා යොදා ගැනීමට දඹුල්ල රෝහල වෙනත් ස්ථානයකට ස්ථාපිත කිරීමට යෝජනා කර ඇත. මෙම රෝහල සංවර්ධනය කිරීම සඳහා පවතින ගැටලු සැලකිල්ලට ගනිමින්, රෝහල රේඛීය සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය යටතට පවරා ගැනීමට යෝජනා කරන ලදී.

ඒ අනුව, මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරවරයා මෙම රෝහල රේඛීය අමාත්‍යාංශයට පැවරීමට එකඟ වී ඇති බවත්, 2026 අප්‍රේල් මස 27 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණ අංක CP/26/0731/815/047 හරහා දඹුල්ල මූලික රෝහල රේඛීය සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය යටතට පවරා ගැනීමට අමාත්‍ය මණ්ඩලය අනුමැතිය ලබා දී ඇති බවත් මෙයින් දැනුම් දෙනු ලැබේ.

තවද, දඹුල්ල මූලික රෝහලේ දැනට සේවය කරන කාර්ය මණ්ඩලය සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශයට අන්තර්ග්‍රහණය කිරීම, රාජ්‍ය සේවා කොමිෂන් සභාව සහ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව සමග ද සාකච්ඡා කර ගනු ලබන ක්‍රියාමාර්ගවලට යටත්ව සිදු කරනු ලැබේ.

විශේෂඥ වෛද්‍ය **අනිල් ජාසිංහ**,
ලේකම්,
සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය.

2026 මැයි මස 22 වැනි දින,
අංක 385, "සුවසිරිපාය "
පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.

EOG 05 - 0234

1A - G 46902 — 28 (2026/05) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*